# මහනුවර අස්ගිරිය මහාවිහාරයීය
## පුස්කොළ පොත් : 1

වයි.කේ. තිස්ස බණ්ඩාර

මහනුවර අස්ගිරිය මහාවිහාරය දැනට වසර හත්සියයක් පැරණි බෞද්ධ ආගමික මධ්‍යස්ථානයකි. සෙංකඩගල රාජධානිය ආරම්භවීමත් සමඟම ඇති වූ අස්ගිරිය මහා විහාරය මුල්කාලීනව ආරණ්‍ය සේනාසනයකි. යාපහුවේ වළස්ගල ආරණ්‍ය සේනාසනයෙන් වැඩම වූ භික්ෂූන් වහන්සේගෙන් ඇරඹී මෙම සේනාසනය මහාවිහාරයක තත්ත්වයට පරිණාමය වී තිබේ. එහි ඓතිහාසිකත්වය පිළිබඳ තොරතුරු දැක්වීම මෙහි අරමුණ නොවන අතර උක්ත තේමාව යටතේ තොරතුරු ප්‍රමාණයක් ඉදිරිපත් කිරීමට මෙය අවස්ථාව කරගනිමු.

එකී විහාරස්ථානයේ ප්‍රධාන සංඝ පරම්පරා තුනකින් පැවත එන ශිෂ්‍යානු ශිෂ්‍ය පරම්පරාවක් සහිත ආරාම (පංසල්) විස්සක් පමණ දැනට ඇත. විවිධ ක්ෂේත්‍ර ඔස්සේ ආගමික, ජාතික, අධ්‍යාපනික හා සමාජීය වශයෙන් සේවාවන් සිදුවෙන එකී පංසල් තුළ පුස්කොළ පොත් රැසක් ඇති බව විශ්වාස කරමු. දැනට අප විසින් කරනු ලැබ ඇති අධ්‍යයනයක් අනුව පංසල් කීපයක බහු විෂයමය පුස්කොළ පොත් රැසක් හඳුනාගැනීමට ලක්ව තිබේ.

ශ්‍රී ලංකාවේ ලේඛන සම්ප්‍රදාය තුළ සුවිශේෂී ස්ථානයක් හිමිව පවතින පුස්කොළ පොත්, දේශීය විඥාපන සම්පත් අතර මුල් තැනක් ගනී. පුස්කොළ පොත් පිළිබඳව යම් යම් ප්‍රකාශන ඉදිරිපත්ව ඇතත් ලංකාවේ සියලුම පුස්කොළ පොත් ගැන පර්යේෂණ කිරීම අසීරු කරුණක්ව ඇත. පළකොට ඇති ඇතැම් ඒවායේද අඩුපාඩු සහිතයි. දැනට දිවයින තුළ පුස්කොළ පොත් ලක්ෂයක් පමණ ඇති බව විශ්වාස කළ හැකිය. මේවා එක් නාම ලේඛනයකට ගැනීම අසිරු කරුණකි. ප්‍රධාන හේතුව බහු විෂය හා බහු භාෂාමය තත්ත්වයෙන් ඒවා පැවතීමයි. අදාළ ක්ෂේත්‍රයේ ප්‍රවීණ අය අඩු නිසාත් දැනට අභාවිත තත්ත්වයෙන් පවතින නිසාත් බොහෝ පුස්කොළ පොත් ඒ ඒ තන්හි පෙට්ටගම් අල්මාරි හෝ පොට්ටනි තුළ විධිමත් හා අවිධිමත් යන දෙයාකාරයෙන්ම පවතී. කුමන ක්‍රමයකින් හෝ මේවා ආරක්ෂා කරගන්නා වූ ගරුතර මහා සංඝරත්නයට හා සෙසු අයිතිකරුවන්ට ජාතියේ ගෞරවාදර ප්‍රණාමය පුදකිරීම වටී.

විවිධ විෂයයන්ට අදාළව වටිනාකම් ඇති උක්ත අප්‍රකට පුස්කොළ පොත් හඳුනාගෙන සමාජයට ඉදිරිපත් කිරීමට දැන් කාලය එළඹ තිබේ. පළත් මට්ටමින් හෝ

ප්‍රාදේශීය මට්ටමින් හෝ ඒවා අධ්‍යයනය කළ යුතුයි. අඩුම තරමින් විහාරස්ථාන මට්ටමින් ඒවා අධ්‍යයනයට ලක්කොට නාමලේඛන හෝ සැකසීම වැදගත් වේ. එය එවිට අදාළ ක්ෂේත්‍රයේ තොරතුරු සොයන අය සඳහා යතුරක් හෝ තොරතුරු මූලාශ්‍රයක් වන්නේය. මින් මතු දක්වනු ලබන පුස්කොළ පොත් නාම ලේඛනය අස්ගිරිය මහා විහාරයේ මුල්ලේගම පංසල ආශ්‍රිත පුස්කොළ පොත් එකතුවට අදාළ වේ. එකී පංසල අස්ගිරි මහා විහාරයේ ප්‍රථම මහා නායක මාහිමිපාණන් වහන්සේගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරපුරින් පැවත එයි. වර්තමානයේදී එය ජාත්‍යන්තර සම්බන්ධතා සහිත බෞද්ධ ආගමික හා අධ්‍යාපනික කේන්ද්‍රස්ථානයක් බවට පත්ව තිබේ.

තත් කේන්ද්‍රස්ථ ශ්‍රී ගුණරතන පුස්තකාලයීය පොත් එකතුව තුළ, අප විසින් සංවිධානය කරනු ලැබ ඇති මතු දැක්වෙන පුස්කොළ පොත් සුරැකිව තැන්පත්කොට තිබේ. පර්යේෂණය කරන්නවුන් සඳහා ඉන් ප්‍රයොජන ලබාගත හැකිය. විධිමත් අවිධිමත් යන දෙයාකාරයෙන්ම පැවති එකී පුස්කොළ පොත් එකතුව ප්‍රතිසංවිධානය කිරීම සඳහා අපට අවස්ථාව ලැබිණි. අස්ගිරි මහාවිහාරයේ පුරාණ මුල්ලේගම පන්සලෙහි අධිපති සහ ශ්‍රී චන්ද්‍රානන්ද බෞද්ධ විද්‍යාලයාධිපති අතිගරු ආචාර්ය ගොඩගම මංගල හිමිපාණන්වහන්සේගේ කාරුණික අවසරය මත එකී සත්කාර්ය කිරීමට හැකිවූ බව සටහන් කරමු. මෙහි දැක්වෙන ලේඛනයට සමානව තවද අස්ගිරි මහා විහාරයේ පංසල් කීපයක පුස්කොළ පොත් නාම ලේඛන සකසනු ලැබ ඇත. ඒවාද ඉදිරියේදී එළි දැක්වීමට අපේක්ෂිතය.

| අනු අංකය | | පොත් අංකය |
|---|---|---|
| 1. | අඞ්ගුත්තර නිකාය | 04 |
| 2. | අච්ඡරියබ්භූතධම්ම සුත්ත අට්ඨකථා | 76 |
| 3. | අත්ථසාලිනී නාම ධම්මසංගහට්ඨ කථා | 08 |
| 4. | අනාගතවංශ දේශනාව | 18 |
| 5. | අනුශාසනා අස්න | 60 |
| 6. | අස්ගිරි තල්පත | 38 |
| 7. | ආඛ්‍යාත වරනැගිල්ල | 78 |
| 8. | ආනන්‍ද ථෙරස්ස වත්‍ථු | 77 |
| 9. | ආලවක සුත්ත | 75 |
| 10. | ආලෝක සූත්‍ර පදඇනුම | 44 |
| 11. | උපසම්පදා කම් වාක්‍ය | 86 |
| 12. | උපාසක ජනාලංකාරය | 15 |
| 13. | උම්මග්ග ජාතකය | 43 |
| 14. | කට්ඨාරි ජාතකය | 89 |
| 15. | කඩයිං පොත | 47 |
| 16. | කථාපොත | 82 |
| 17. | කවන්ද ප්‍රේත වස්තුව සහ තවත් කථා | 74 |

| | | |
|---|---|---|
| 18. | කුඩා පිරිත් පොත | 95 |
| 19. | කුරුධර්ම ජාතකය | 53 |
| 20. | කුරු ධර්ම ජාතකය | 59 |
| 21. | කේන්ද්‍රඵල කියන පොත | 37 |
| 22. | ඛදිරංගාර ජාතකය | 58 |
| 23. | චක්කවත්ති සීහනාද සූත්‍රය | 82 |
| 24. | චකකවත්ති සීහනාද සූත්‍රය | 106 |
| 25. | චූර්නිකා | 93 |
| 26. | ජාතකට්ඨ කථා | 101 |
| 27. | ජිනදන්තධාතුවංස හා හාත්ථවනගල්ල විහාරවංස | 24 |
| 28. | ජිනාලංකාර වණ්ණා | 06 |
| 29. | දම්සක් පැවතුම් සූත්‍රය | 68 |
| 30. | දසධම්ම සූත්‍රය | 71 |
| 31. | ධම්පියා සන්න පොත් වහන්සේ | 21 |
| 32. | දම්සක් පැවතුම් සූත්‍රය | 87 |
| 33. | ධම් ප්‍රබන්ධය | 51 |
| 34. | ධම් ප්‍රබන්ධය | 63 |
| 35. | ධම් ප්‍රබන්ධය | 80 |
| 36. | ධම් ප්‍රබන්ධය - හත්ථාලවක කථාව | 85 |
| 37. | ධම් සංග්‍රහය | 70 |
| 38. | ධාතුවංසය | 30 |
| 39. | ධාතුවංශය | 97 |
| 40. | නම්පොත | 103 |
| 41. | නමස්කාර සන්නය | 34 |
| 42. | නමාෂ්ට ශතක | 62 |
| 43. | නිමි ජාතකය | 45 |
| 44. | පද ඇනුම | 31 |
| 45. | පන්සිය පනස් ජාතක පොත | 01 |
| 46. | පන්සිය පනස් ජාතක පොත | 02 |
| 47. | පන්සිය පනස් ජාතක පොත | 03 |
| 48. | පරිත්තාන ධම්ම පොත්ථකං | 13 |
| 49. | පරිත්තාන ධම්ම පොත්ථකං | 14 |
| 50. | පාළිමුත්තක විනය විනිච්ඡය සංගහො | 57 |
| 51. | පිරවාණා පොත් වහන්සේ | 40 |
| 52. | පිරවාණා පොත් වහන්සේ | 41 |
| 53. | පුස්කොළ හෝඩිය | 46 |
| 54. | පුරාණ වෙස්සන්තර ජාතකය කවි | 100 |
| 55. | පූජාවලිය | 11 |
| 56. | බාල පණ්ඩිත සූත්‍රය | 20 |

| | | |
|---|---|---|
| 94. | සියම් පොතක් | 36 |
| 95. | සුදර්ශණ සූත්‍රය | 16 |
| 96. | සූත්‍ර එකතුවක් | 09 |
| 97. | සූවිසි විවරණ හා බුද්ධ චරිතය | 79 |
| 98. | ස්‍යාමෝපසම්පදාවත | 20 |



අස්ගිරිය මුල්ලේගම පන්සලට අයත් ඉහත පුස්කොළ පොත් සියල්ල දැනට, අස්ගිරියේ ශ්‍රී පලිපාන චන්දානන්ද බෞද්ධ පර්යේෂණායතන පුස්තකාලයේ තැන්පත් කොට තිබේ.

ඉහත පුස්කොළපොත් හා අස්ගිරි මහා විහාරයේ තවද පුස්කොළපොත් පිළිබඳ වැඩි විස්තර සඳහා බලන්න ඃ **බණ්ඩාර, තිස්ස, වයි.කේ.** (2007) මහනුවර අස්ගිරිය මහාවිහාරයීය පුස්කොළපොත් එකතු පිළිබඳ ඓතිහාසික ග්‍රන්ථ විද්‍යාත්මක අධ්‍යයන, කැලණිය විශ්ව විද්‍යාලය, සමාජීය විද්‍යාපති පශ්චාත් උපාධි නිබන්ධය (පරිගණක මුද්‍රිත)

**අස්ගිරිය මුල්ලේගම පන්සලෙහි ලිපිනය ඃ-**

ශ්‍රී පලිපාලන චන්දානන්ද බෞද්ධ පර්යේෂණායතන පුස්තකාලය,
මුල්ලේගම පන්සල,
අස්ගිරිය,
මහනුවර.